# පුරප්පාඩු

# ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම

ජාතික අධ්‍යාපන ආයතනයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ පිළිබඳව වැඩි විස්තර ජාතික අධ්‍යාපන ආයතනයේ www.nie.ac.lk වෙබ් අඩවියේ "News & Events" ඔස්සේ බාගත කරගත හැක. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉහත වෙබ් අඩවියට පිවිසීමෙන් බාගත කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය, තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2024.04.02 දිනට හෝ එම දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු වේ.

**තනතුරු : 01. අධ්‍යක්ෂ (ඉංග්‍රීසි භාෂා)**

**02. අධ්‍යක්ෂ (මුද්‍රණ හා ප්‍රකාශන)**

**සේවා ගණය: ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (HM 1-1)**

**අනෙකුත් සේවා කොන්දේසි**

- අයදුම්පත්‍රය සමග උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන / වෘත්තීය සහතික වල සහ සේවා සහතික වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.
- රාජ්‍ය සංස්ථා / මණ්ඩල / දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත ආයතන වල සේවය කරන්නන් තම අයදුම්පත්‍ර ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු වේ.
- මෙම තනතුරු ස්ථිරය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් තම වැටුපෙන් 8% ක් සේවක අර්ථ සාධක අරමුදලට දායක කළ යුතුය. ආයතනය විසින් 12% ක් සේවක අර්ථ සාධක අරමුදලට හා 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක කරයි.
- මූලික වැටුපට අතිරේකව වෘත්තීය දීමනාව, ප්‍රවාහන දීමනාව, පර්යේෂණ දීමනාව හා අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**